**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරණ විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරණ විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 20 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලදී.

## 1.4 විගණන නිරීක්ෂණය

-------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| මුදල් රෙගුලාසි | | | |
| 128(1) (ඇ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහි ලා පාර්ලිමේන්තුවේ අභිලාෂයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| | | 2. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම සහ අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.5 |
| | | 3. වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන ඌන උපයෝජනය | 2.6 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර | 1. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතීම | 2.3.1 |

| | | | | |
|---|---|---|---|---|
| | සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 2. | වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.3.2 |
| 128 (1) (එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. | ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.1 |
| | | 2. | අවිධිමත් ගනුදෙනු | 2.4 (අ), (ආ), (ඇ) |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණු නමුත් එම ව්‍යාපෘති නිමනොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2017 දෙසැම්බර් 31 දින වනවිට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | | රු.මිලියන | |
| (අ) | උසස් පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම - මිරිස්ස | 53.1 | 2017.01.01 | 30.09 | 2017 ඔක්තෝබර් 09 දිනැති අංක MOD/DEF/13/27/AD දරන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් ඉදිකිරීම් නතර කිරීමට උපදෙස් ලබාදී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ආධුනික නැවියන් සඳහා නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම - මිරිස්ස | 34.6 | 2017.01.01 | 4.1 | -එම- |

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර සැපයීම් සහ සේවා ලබාගැනීම**

---

**ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වටිනාකම රු.1,014,291 ක් සහ රු.1,431,668 ක් වූ Rigid Hull Inflatable Boat දෙකක් සැපයුම්කරු විසින් සති 11 සිට සති 15 දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සහිතව සපයා තිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව ඊට අදාළ රු.154,812 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

---

**2.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

(අ) වටිනාකම රු.මිලියන 32.99 ක්වූ අංක CG 410 දරන මුහුදු යාත්‍රාව 2016 ඔක්තෝබර් මස සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා අක්‍රීයව පවතින නමුත් එය අළුත්වැඩියා කර භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු 2018 මැයි 20 දින වන විටත් සිදුකර නොතිබුණි. දීර්ඝ කාලයක් යාත්‍රාව යාත්‍රා නොකර ගාල් කර තැබීමෙන් එහි අභ්‍යන්තර කොටස් හා අනෙකුත් කොටස්වලටද හානි සිදුවීමට ඉඩ ඇති බවත් ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉටුනොවීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී CG 406 යාත්‍රාව රු.මිලියන 2.10 ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණි. එසේ වුවද පැය 47 ක් වැනි ඉතා සීමිත කාලයක් පමණක් ධාවනය කර තිබුණු බව විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම යාත්‍රාව කාර්යක්ෂමව උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**2.3.2 වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---

(අ) දෙපාර්තමේන්තුව විසින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට අයත් ඉඩම් හෙක්ටයාර් 0.1517 ක් 2011 ජුනි 27 දින සිට 2018 මාර්තු 08 දින වන විටත් අවිධිමත් අයුරින් පරිහරණය කරමින් පැවතුණි.

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 1.1285 ක ඉඩමක සහ දික්ඕවිට ධීවර වරායට අයත් හෙක්ටයාර් 0.1517 ක ඉඩම් කැබලි දෙකක, ඉඩම හා ගොඩනැගිලි සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 30.80 ක මුදලක් වැය කර තිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති රාජකාරීන් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා විවිධ වර්ගයේ යාත්‍රා මිලදී ගැනීමට අවශ්‍ය බව දන්වා රු.මිලියන 17 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එහෙත් අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලැයිස්තුවට බාහිරව වෙනත් විෂයයන් මිලදී ගැනීම සඳහා ද එම ප්‍රතිපාදනයන් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩ ලැබුණු පසු ඒවායේ තත්ත්ව පරීක්ෂණ වාර්තා සකස් කර එම වාර්තා සතුටුදායක නම් පමණක් ගෙවීම් අනුමත කළ යුතු වුවත් රු.මිලියන 8.06 ක් වටිනා මිලදීගැනීම් 07 ක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් තත්ත්ව පරීක්ෂණ වාර්තා සකස් කිරීමටත් ප්‍රථමයෙන් සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණි.

(ඇ) අදාල වැඩය හෝ සේවාව සම්පූර්ණ කර නොගෙන මුදල් රෙගුලාසි 137, 138 හා 139 හි විධිවිධානවලට අනුකූල නොවී එකතුව රු.11,484,403 ක් වටිනා චෙක්පත් 7 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනයේදී නිකුත් කර තිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සළසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 31.41 | 24.34 | 7.07 | 22.51 |
| | මූලධන | 62.39 | 43.82 | 18.57 | 29.77 |
| | **එකතුව** | **93.80** | **68.16** | **25.64** | **27.34** |
| 2014 | පුනරාවර්තන | 32.66 | 28.41 | 4.25 | 13.01 |
| | මූලධන | 32.00 | 31.12 | 0.88 | 2.75 |
| | **එකතුව** | **64.66** | **59.53** | **5.13** | **7.94** |
| 2015 | පුනරාවර්තන | 32.27 | 30.62 | 1.65 | 5.11 |
| | මූලධන | 104.65 | 58.76 | 45.90 | 43.86 |
| | **එකතුව** | **136.92** | **89.38** | **47.54** | **34.72** |
| 2016 | පුනරාවර්තන | 39.27 | 37.82 | 1.45 | 3.70 |
| | මූලධන | 37.77 | 32.49 | 5.28 | 13.97 |
| | **එකතුව** | **77.04** | **70.31** | **6.73** | **8.74** |
| 2017 | පුනරාවර්තන | 40.21 | 35.82 | 4.39 | 10.93 |
| | මූලධන | 289.40 | 196.08 | 93.32 | 32.25 |
| | **එකතුව** | **329.61** | **231.90** | **97.71** | **29.64** |

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.2,700,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 87 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.6 වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නිල ඇඳුම් මිලදීගැනීම සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් රු.මිලියන 0.97 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 4.03 ක් හෙවත් සියයට 80.7 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරින් 90 කින් හා නාවිකයින් 1213 ක් ද්විතියික පදනම මත අනුයුක්ත කර තිබුණි.